# ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා දූත පිරිසක් සිවුවැනි බිම්ස්ටෙක් සමුළුවට සහභාගී වෙයි ; බිම්ස්ටෙක් සංවිධානයේ සභාපති ධුරය ශ්‍රී ලංකාවට

2018 අගෝස්තු 30 – 31 යන දෙදින නේපාලයේ කත්මණ්ඩු නුවර පැවැත්වෙන බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වූ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මුලපිරීම හෙවත් බිම්ස්ටෙක් සංවිධානයේ සිවුවැනි සමුළුවට සහභාගී වන ශ්‍රී ලංකා දූත පිරිසේ නායකත්වය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් දරනු ලබයි. සමුළුව අවසානයේදී, බිම්ස්ටෙක් සංවිධානයේ වත්මන් සභාපතිත්වය දරන නේපාලය විසින් එම සභාපති ධුරය ශ්‍රී ලංකාවට පිරිනැමීමට නියමිතය.

සමුළුවට සහභාගි වන රාජ්‍ය නායකයන්ගේ හුදෙකලා රැස්වීමක්ද ඇතුළත් සිවුවැනි බිම්ස්ටෙක් සමුළුවට පෙර 16 වැනි බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීමද, බිම්ස්ටෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ 19 වැනි සැසිවාරයද පැවැත්වෙයි.

ශ්‍රී ලංකාවේ සහ මියන්මාරයේ ජනාධිපතිවරු, ඉන්දියාවේ, බංග්ලාදේශයේ, නේපාලයේ සහ තායිලන්තයේ අග්‍රාමාත්‍යවරු මෙන්ම භූතාන රජයේ ප්‍රධාන උපදේශකවරයා මෙම සමුළුව සඳහා සහභාගි වන සිය දූත පිරිස්වල නායකත්වය දරති. සමුළුවේ අවසන් දිනය වන අගෝස්තු මස 31 වැනිදා රාජ්‍ය නායකයන් විසින්, " සාමකාමීබවෙන්, සශ්‍රීකත්වයෙන් සහ තිරසරබවෙන් යුත් බෙංගාල බොක්ක ආශ්‍රිත කලාපයක්" යන මැයෙන් යුත් සිවුවැනි බිම්ස්ටෙක් සමුළුවේ ප්‍රකාශනය සම්මත කරගැනීමට නියමිතය.

මීට අමතරව, සමුළුව අතරතුරදී බිම්ස්ටෙක් විදුලි ජාලක අන්තර් සම්බන්ධකතාව වෙනුවෙන් එළැඹෙන අවබෝධතා ගිවිසුමකටද රාජ්‍ය නායකයන් ඉදිරිපිටදී අත්සන් තැබීමට නියමිතය.

සමුළුවේ රැස්වීම් අතරතුරදී බිම්ස්ටෙක් කලාපයේ වර්ධනය සහ ආර්ථික සෞභාග්‍යය ඉහළ නැංවීම සඳහා ප්‍රමුඛතා අංශ යටතේ එකඟ වූ මූලාරම්භයන් රැසක් සමාලෝචනයට ලක් කෙරෙනු ඇත. වෙළෙඳ හා ආයෝජන, තාක්ෂණය, බලශක්තිය, ප්‍රවාහනය හා සන්නිවේදනය, සංචාරක කටයුතු, ධීවර කටයුතු, කෘෂිකර්මය, සංස්කෘතික සහයෝගිතාව, පරිසරය සහ ආපදා කළමනාකරණය, මහජන සෞඛ්‍යය, පුද්ගලාන්තර සම්බන්ධතා, දිළිඳුකම පිටුදැකීම, ත්‍රස්තවාදය පිටුදැකීම හා ජාත්‍යන්තර අපරාධ, සහ දේශගුණික විපර්යාස බිම්ස්ටෙක් සංවිධානයේ සහයෝගීතාව යටතට අයත් ප්‍රමුඛතා අංශ වේ.

1997 වසරේදී ආරම්භ කරන ලද බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහාවූ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මුලපිරීම (බිම්ස්ටෙක්) දකුණු සහ ගිණිකොණදිග ආසියානු රටවල් එකිනෙකා හා සම්බන්ධ කරයි. බෙංගාල බොක්ක ආශ්‍රිත කලාපය ලෝක

ජනගහනයෙන් 21% ක ප්‍රතිශතයකට නිජබිම වන අතර, එහි සාමාන්‍ය දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය 6.5% කි.

තාක්ෂණ අංශය සඳහා ප්‍රමුඛත්වය දරන රට ලෙස ශ්‍රී ලංකාව නම් කර ඇති අතර, මේ යටතේ ශ්‍රී ලංකාව තුළ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සලකා බලමින් පවතියි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඉලක්ක කරගනිමින් සාමාජික රටවල් අතර සහයෝගීතාව හා හවුල්කාරීත්වය ඔස්සේ ඔවුන්ගේ තාක්ෂණ පදනම පුළුල් කිරීම මෙම මධ්‍යස්ථානයෙන් අපේක්ෂා කෙරේ.

තෙවැනි බිම්ස්ටෙක් සමුළුව 2014 වසරේදී මියන්මාරයේ නේ පී ටෝ නුවර පැවැති අතර, 2016 වසරේදී බිම්ස්ටෙක් නායකයන්ගේ හුදෙකලා රැස්වීමක්ද, බ්‍රික්ස් සහ බිම්ස්ටෙක් සංවිධානවල ඒකාබද්ධ සමුළුවක්ද ඉන්දියාවේ ගෝආ හිදී පැවැත්විණි.

විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය වසන්ත සේනානායක මහතා සහ විදේශ අමාත්‍යාංශයේ හා කත්මණ්ඩු නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරීහුද, සමුළුවට සම්බන්ධ රැස්වීම්වලට සහභාගී වෙති.

සිය නේපාල සංචාරය අතරතුර ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සැප්තැම්බර් මස 01 වැනිදා එරට ජනාධිපතිනි බිද්‍යා දේවි භන්දාරි මහත්මිය සහ අග්‍රාමාත්‍ය ඛඩ්ගා ප්‍රසාද් ඔලි මහතා හමුවීමට නියමිතය. ශ්‍රී ලංකා ජනාධිපතිවරයා වෙනුවෙන් නේපාල ජනාධිපතිනිය පවත්වන රාත්‍රී භෝජන සංග්‍රහයකටද ජනාධිපති සිරිසේන මහතා සහභාගී වනු ඇත.

මීට අමතරව, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සැප්තැම්බර් මස 01 වැනිදා ලුම්බිණි නුවරට යෑමට නියමිත අතර සැප්තැම්බර් මස 02 වැනිදා කත්මණ්ඩු නුවර සාක් මහලේකම් කාර්යාලයට පැමිණ එහි පැවැත්වෙන රුක් රෝපණ වැඩසටහනකටද එක්වීමට නියමිතය.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ

2018 අගෝස්තු 28